අප්‍රේල් 24, 2022 දින විරෝධතාකරුවන්ගේ ගමන වැළැක්වීම සඳහා, ඔවුන්ට හානි සිදුවිය හැකි ආකාරයට තියුණු උල් සවි කොට, ඒවා කළු ඉටි කොළ වලින් සඟවා නිර්මාණය කළ මාර්ග බාධක පොලිසිය විසින් යොදාගෙන තිබූ බව මාධ්‍ය මගින් වාර්තා කර තිබිණි. මේ සම්බන්ධයෙන් සමාජ මාධ්‍ය තුළ දැඩි කතිකාවක් ඇතිවී තිබූ අතර, ශ්‍රී ලංකා නීතීඥ සංගමය මගින්ද මෙයට විරෝධය පළ කර තිබිණි.

මේ සම්බන්ධයෙන් වාර්තා කර තිබූ සහ වාර්තා කර නොතිබූ රූපවාහිනී රාත්‍රී ප්‍රවෘත්ති විකාශයන් මෙසේ දැක්විය හැක.

(මෙම දත්ත සටහන සඳහා භාවිතා වී ඇත්තේ අප්‍රේල් 24, 2022 රූපවාහිනී රාත්‍රී සිංහල ප්‍රධාන පුවත් විකාශයන් පමණක් බවත්, වෙනත් වේලාවන් හි විකාශය වන පුවත් ඇතැම් විටක මෙම දත්ත වලට වඩා වෙනස් විය හැකි බවත් කරුණාවෙන් සලකන්න.)